# දේව අනාවරණය පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා ධර්ම ව්‍යවස්ථාව (DOGMATIC CONSTITUTION ON DIVINE REVELATION - *DEI VERBUM*): ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

ඒ. ටී. එම්. පෙරේරා

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය සහ ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

කතෝලික සභාවේ නවෝදය අරභයා 1962-65 මුළුදුන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් නිකුත් කරන ලද ප්‍රකාශන අතරින් **දේව අනාවරණය පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව** ලේඛනගත වීමේ පසුබිම ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතයට ගෙන ඓතිහාසික විමර්ෂණයක් ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

දේව අනාවරණය පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව සම්පාදනයේ දී, ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවේ සහ පළමු වන වතිකාන මන්ත්‍රණ සභාවේ අදහස් උපුටා ගෙන ඇති බැවින් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් ළඟා කර ගැනීමට උත්සහ ගත් සභා නවෝදය මෙම ධර්ම ව්‍යවස්ථාවෙන් නිරූපණය වන්නේ ද යන්න එහි ලා විවාදයට ගත් සැසිවාර ලේඛන මගින් පුළුල් ව විමසීම මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව යි.

මෙම ධර්ම ව්‍යවස්ථාව සම්පාදනයේ දී, ට්‍රෙන්ට් හා පළමු වතිකාන මන්ත්‍රණ සභා අදහස් උපුටා ගෙන ඇති මුත් ඉන් ඔබ්බට යමින් ශුද්ධ ලියවිල්ලේ සහ සභා සම්ප්‍රදායේ අසමසම බව මේ මගින් මනාව යොදා ගෙන ඇතැයි යන්න සාධනය කර ගත හැකි විය.

ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලෙස දැක්විය හැකි වේ. ප්‍රාථමික මූලාශ්‍රයට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පද:** දේව අනාවරණය, ශු. ලියවිලි, සම්ප්‍රදාය, කෙටුම්පත